**ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී සමාගම සහ එහි පරිපාලිතය- 2021**

## 1.1 මතය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී (“සමාගම”) හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයේ (“සමූහය”) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දින තෙක් ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr>
<td>රුපියල් 158,260,826 ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයේ පවතින අතර එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ප්‍රත්‍යාගණනය කර හෝ සමාලෝචනය කර ඒවා ගිණුම්ගත කිරීමට සමාගම කටයුතු කර නොමැත. එම තොරතුරු පහත පරිදි වේ.
<table>
<tr><th>සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම්</th><th>වටිනාකම (රු)</th></tr>
<tr><td>යන්ත්‍රෝපකරණ(අයිපී යටතේ)</td><td>108,992,778</td></tr>
<tr><td>යන්ත්‍රෝපකරණ (පීපීඊ යටතේ)</td><td>215,409</td></tr>
<tr><td>මෝටර් රථ</td><td>21,401,770</td></tr>
<tr><td>කාර්යාල උපකරණ</td><td>627,763</td></tr>
<tr><td>ලී බඩු සහ සවිකිරීම්</td><td>17,531,936</td></tr>
<tr><td>පරිගණක උපාංග</td><td>9,491,170</td></tr>
<tr><td>එකතුව</td><td>158,260,826</td></tr>
</table>
</td>
<td>2012 වර්ෂයේදී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වෙත අනුගත වීමත් සමග බොහෝ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ප්‍රත්‍යාගණනය කරන ලදී. කෙසේ වෙතත්, නැවත තක්සේරු කරන ලද වත්කම්ද 2018 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇත. 2018 වර්ෂයේදී රු.107,996,584.25 ක් වූ සම්පූර්ණ ක්ෂය වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ආරම්භ කළ ක්‍රියාමාර්ග සාර්ථක නොවූයේ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට පෙර ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදු කළ යුතු බව විගණකවරුන් පෙන්වා දුන් බැවිනි. අනාගතයේ දී ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂික පදනමින් ප්‍රත්‍යාගණනය කිරීමට ක්‍රියා කරනු ඇත.</td>
<td>භාවිතයේ පවතින ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය නැවත තක්සේරු කිරීමට නිර්දේශ කරමි.</td>
</tr>
</table>

### 1.5.2 නුසුදුසු තක්සේරු කිරීම් හෝ ඇස්තමේන්තු කිරීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පීඩීඑල් ටවර් ගොඩනැගිල්ල දැනට වසර 50ක් පුරා ක්ෂය වෙමින් පවතින අතර එය ගොඩනැගිල්ලේ ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා අඩු බව පෙනී යයි.<br>වත්කම එහි ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා අඩු කාල සීමාවක් තුළ ක්ෂය වූ විට වත්කම අවතක්සේරු කරනු ලබන අතර ක්ෂය වියදම ප්‍රතිලාභයට නිවැරදිව නොගැලපෙන බැවින් ලාභය නිවැරදිව වාර්තා නොවේ. | කළමණාකාරිත්වය විසින් 2022 අගෝස්තු මාසයේදී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් (සීඊසීබී) ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩැනැගිල්ලේ අවශේෂ ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ වාර්තාවක් ලබා ගන්නා ලදී. ‘‘අවශේෂ ජීව කාලය පිළිබඳ පුරෝකථනය’’ ලෙස නම් කර ඇති වාර්තාව ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ සඳහන් පරිදි ලංකා බැංකු මූලස්ථාන ගොඩැනැගිල්ලේ අවශේෂ ප්‍රයෝජනවත් ජීව කාලය/ සේවා කාලය මෙතැන් සිට (2022 වසර) වසර 30ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව ඊ ඇන්ඩ් වයි විගණකවරුන් සමඟ සාකච්ඡා කර කළමනාකරණය විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩැනැගිල්ලේ අවශේෂ ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ පුරෝකථන මත පදනම්ව අවශ්‍ය ගැලපීම් කිරීමට නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 650 ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රුපියල් මිලියන 474 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 176 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම්, අනෙකුත් මෙහෙයුම් ආදායම් සහ මූල්‍ය ආදායම පිළිවෙලින් සියයට 11.1 කින්, සියයට 262.1 කින් සහ සියයට 17.8 කින් වර්ධනය වීම සහ ආදායම් බදු සියයට 36.3 කින් අඩු වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවනතා විශ්ලේෂණය

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතම විශ්ලේෂණය වැඩි වීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ පහත දැක්වේ.

| විස්තරය | විචලා අගය වැඩි වීම/ (අඩු වීම) (රු.) | විචලනය % | විචලනයට හේතුව |
|---|---|---|---|
| ආදායම | 91,560,928 | 11.1 | කොවිඩ් 19 වසංගතයේ බලපෑම සැලකිල්ලට ගෙන 2020.04.01 දින සිට 2020.09.30 දින දක්වා කාලය සඳහා ලංකා බැංකුවට ලබා දුන් රුපියල් 96,944,202 ක කුලී ගාස්තුවේ වට්ටම 2021 වර්ෂයේදී ලබා නොදීම හේතුවෙන් ආදායම ප්‍රධාන වශයෙන් සියයට 11.1 කින් ඉහල ගොස් තිබුණි. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 27,546,048 | 262.1 | ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපූරණය වශයෙන් ලංකා බැංකුවෙන් ලද රු.27,777,778 ඇතුළු විවිධ ආදායම් වැඩිවීම හේතුවෙන් වෙනත් මෙහෙයුම් ආදායම ප්‍රධාන වශයෙන් සියයට 262.1 කින් ඉහළ ගොස් ඇත. |
| සෘජු වියදම් | 8,518,094 | 6.2 | නඩත්තු වියදම සියයට 30.6 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන සෘජු වියදම් සියයට 6.2 කින් ඉහළ ගොස් ඇත. |
| මූල්‍ය ආදායම | 30,848,489 | 17.8 | කොටස් සුරකුම්පත්වලින් ලද ලාභාංශ ආදායම රු.37,325,842 කින් ඉහළ යාම හේතුවෙන් මූල්‍ය ආදායම සියයට 17.8 කින් ඉහළ ගොස් ඇත. |
| ආදායම් බදු වියදම් | (78,589,031) | (36.3) | බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 24 දක්වා අඩු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බදු වියදම සියයට 13.6 කින් අඩු වීම සහ පෙර වසරේ ආදායම් බදු අධි වෙන් කිරීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන ආදායම් බදු වියදම සියයට 36.3 කින් පහළ ගොස් ඇත. |
| කාල සීමාවේදී අත්හිටුවන ලද මෙහෙයුම් වලින් ලද බදු පසු ආදායම | (34,408,099) | (84.8) | කොළදෙණිය ජලවිදුලි (පුද්ගලික) සමාගම අත්හිටුවන ලද මෙහෙයුම් ලෙස වර්ගීකරණය කර 2021 මාර්තු 30 දින එය විකිණීම මේ සඳහා හේතු විය. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂය සඳහා වූ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | 2021 | 2020 |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශත) | 58 | 46 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ප්‍රතිශත) | 15 | 14 |
| ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ප්‍රතිශත) | 14 | 11 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 20.7:1 | 14.7:1 |

පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ සියළු අනුපාතයන්හී වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණයේ අකාර්යක්ෂමතාවන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | සමාගම කොළඹ කොටස් වෙළඳපොලේ 7.13.1 ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුකූල නොවීම හේතුවෙන් 2014 මාර්තු 21 වන දින සිය ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. එම ක්‍රියාවලියේ සංකීර්ණත්වය සහ ඒ සඳහා කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ලැයිස්තුගතයෙන් ඉවත් වීමේ ක්‍රියාවලිය වසර හතකට වඩා ප්‍රමාද වී ඇත. 2020 ජූලි 07 වන දින අනුකූල නොවීමේ නිවේදනය කොළඹ කොටස් වෙළඳපොල වෙත ඉදිරිපත් කර ඇත. මේ වන විට සමාගම කොටස් ප්‍රතිමිලදී ගැනීම මගින් ලැයිස්තුගතයෙන් ඉවත් වීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය ඉටු කරමින් පවතී. | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (එස්ඊසී) විසින් 2001 දෙසැම්බර් 18 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක 1215/2 හි 5 (2) (අ) රීතියට අනුව, 2022 මාර්තු 29 වන දින පැවති විශේෂ මහසභා රැස්වීමට සහභාගී වූ කොටස් හිමියන්ගෙන් සියයට 75% වැඩි පිරිසක් විසින් ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය අනුමත කරන ලදී. එම නීතියට අනුව සමාගම ලැයිස්තුගතයෙන් ඉවත් වීමේ අයදුම්පත්‍රය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත 2022 අප්‍රේල් 08 වන දින භාර දුන් අතර 2022 ජුනි 09 වන දිනැති එම කොමිෂන් සභාවේ ලිපිය මගින් කොටසක මිළ රු.183 බැගින් වූ ඉවත්වීමේ මිළකට කොළඹ කොටස් හුවමාරුවේ (සීඑස්සී) නිල ලැයිස්තුවෙන් කොටස් ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලියට සහ කොමිෂන් සභාවේ 5 වන රීතිය පරිදි එම ක්‍රියාවලියේ ඉතිරි ක්‍රියාපරිපාටි අනුගමනය කිරීමට අනුමතිය ලබා දී ඇත.<br>ඒ අනුව සමාගම කොටස් නැවත මිළදී ගැනීමේ ආරාධනාව 2022 ජූලි 14 දින විවෘත කරන ලද අතර එය 2022 අගෝස්තු 10 වන දින අවසන් කරන ලදී. ලංසුව පිළිගත් | සමාගම ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය ඉලක්කගත දිනයන්හී සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |

කොටස්හිමියන් සඳහා ගෙවීම කොළඹ කොටස් හුවමාරුවේ රීතීන් විසින් නියම කරන ලද කාල සීමාව තුළ සම්පූර්ණ කරන ලදී. 2022 ඔක්තෝම්බර් 12 වන දින ගෙවීම් තහවුරු කිරීමේ සාක්ෂි සහ අනෙකුත් අදාළ ලියකියවිලි සමග කොළඹ කොටස් හුවමාරුව වෙත ප්‍රකාශයක් ලබා දෙන ලදී. සමාගම ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය සඳහා කොළඹ කොටස් හුවමාරුවේ අනුමැතිය අපේක්ෂාවෙන් පසු වේ. තවද කොටස් ප්‍රතිමිලදී ගැනීමේ සහ අවලංගු කිරීමේ ආකෘති පත්‍ර 9 සමාගම් රෙජිස්ටාර් (ආර්ඕසී) වෙත ගොනු කරන ලදී.

කොළඹ කොටස් හුවමාරුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා සමාගම පහත ක්‍රියාවලීන් සම්පූර්ණ කළ යුතුය.

- පුවත්පත් සහ ගැසට් නිවේදනය මගින් භාෂා තුනෙන්ම දැන්වීම් පල කිරීම.
- සමාගම් රෙජිස්ටාර් වෙත ආකෘති පත්‍ර 39 (සමාගමේ තත්වය පොදු සමාගමක සිට පෞද්ගලික සමාගමක් ලෙස වෙනස් කිරීම) සහ ආකෘති පත්‍ර 3 (සමාගමේ නම ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී සිට ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම ලෙස වෙනස් කිරීම) ගොනු කිරීම.
- සමාගම් රෙජිස්ටාර් වෙතින් නව සංස්ථාපිත සහතිකය ලද පසු කොටස් ප්‍රතිමිලදී ගැනීමේ යෝජනාව පිළි නොගත් කොටස්හිමියන් සඳහා නව කොටස් සහතික නිකුත් කිරීම. මෙම ක්‍රියාවලිය නව සංස්ථාපන සහතිකයේ දිනයේ සිට මසක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය.

2022 ඔක්තෝම්බර් 30 වන විට සමාගම් ලැයිස්තුගතයෙන් ඉවත් වීමේ ක්‍රියාවලිය සඳහා කොළඹ කොටස් හුවමාරුවේ අනුමිතිය ලබා ගත හැකි නම් 2022 නොවැම්බර් අග වන විට සමස්ථ ක්‍රියාවලිය අවසන් කිරීමට සමාගම බලාපොරොත්තු වේ.

**3.2 ව්‍යාපෘති හා ප්‍රාග්ධන කටයුතු වල ප්‍රමාදයන්**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රධාන වැඩ සැලසුම්, ඉලක්ක සහ 2021 වර්ෂය තුලදී සමාගම විසින් සිදු කරන ලද සත්‍ය කාර්යයන් අතර සැලකිය යුතු වෙනස්කමක් නිරීක්ෂණය විය. විස්තර සඳහා ඇමුණුම I බලන්න.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**විගණන නිරීක්ෂණය**

අ 2021 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කාර්ය මණ්ඩලය සහ සත්‍ය සේවක මණ්ඩලය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී. පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා අදාළ පුද්ගලයිනු බඳවා ගැනීම සඳහා සමාගම පියවර ගෙන නොමැත.

| **දෙපාර්තමේන්තුව** | **අනුමත කාර්ය මණ්ඩලය** | **2021.12.31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය** | **වෙනස** |
|---|---|---|---|
| විධායක කාර්ය මණ්ඩලය | 15 | 13 | 02 |
| නඩත්තු දෙපාර්තමේන්තුව | 61 | 51 | 10 |
| මූල්‍ය දෙපාර්තමේන්තුව | 18 | 16 | 02 |
| මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුව | 16 | 13 | 03 |
| ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව | 03 | - | 03 |
| එකතුව | 113 | 93 | 20 |

තවදුරටත් සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් පහත පරිදි නිරීක්ෂණය විය.

| විස්තරය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 2020.12.31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය | **99** |
| වයස අවුරුදු 60 දී විශ්‍රාම යාම | (6) |
| වයස අවුරුදු 55 දී විශ්‍රාම යාම | (2) |
| ඉල්ලා අස් වීම | (4) |
| | **87** |
| නව බඳවා ගැනීම් | 4 |
| නැවත සේවයට බඳවා ගැනීම් | 2 |
| **2021.12.31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය** | **93** |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

**විධායක කාර්ය මණ්ඩලය**

දැනට පීඩීඑල් ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන්නේ ලංකා බැංකුවට බාධාවකින් තොරව සේවා සැපයීම සඳහා අත්‍යාවශ්‍ය වන විධායක නිලධාරීන්ගේ අවම අවශ්‍යතාවය පමණි.

වරින් වර සිදු කරනු ලබන අවශ්‍යතා විශ්ලේෂණය මත පදනම්ව අවශ්‍ය විධායක පුරප්පාඩු දෙක පිරවීමට කළමනාකාරීත්වය අපේක්ෂා කරනු ලැබේ.

**විධායක නොවන කාර්ය මණ්ඩලය**

**නඩත්තු දෙපාර්තමේන්තුව**

2021 පෙබරවාරි, අප්‍රේල්, ජූලි, අගෝස්තු සහ ඔක්තෝම්බර් මාසවල සහ 2022 අප්‍රේල් සහ ඔක්තෝම්බර් මාසවල පුවත්පත් දැන්වීම් මගින් පුරප්පාඩු පිරවීමට උත්සාහ කරන ලදී. බොහෝ අවස්ථාවලදී අපේක්ෂකයින් අදාල අපේක්ෂිත තත්වයන්ට නොගැලපීම සහ තෝරා ගන්නා ලද අපේක්ෂකයින්ගේ වැටුප් අපේක්ෂාවන් සපුරාලීමය නොහැකි වීම හේතුවෙන් එම උත්සාහයන් මඟ හැරුණි. තවද මේ වන විට සේවකයින් විදේශ රැකියා සඳහා ආයතනය හැර යන බව නිරීක්ෂණය විය. පසුගිය

**නිර්දේශය**

පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

2021 වර්ෂය තුලදී සියයට 12.5 ක සේවක පිරිවැටුමක් නිරීක්ෂණය විය.

වසරට සාපේක්ෂව පුවත්පත් දැන්වීම් අයදුම්පත් කිහිපයක් ලැබී ඇත. කෙසේ වෙතත් ඇතැම් පුරප්පාඩු අභ්‍යන්තර උසස්වීම් මගින් පිරවීමට කටයුතු කරමින් පවතී.

**මූල්‍ය දෙපාර්තමේන්තුව**

වරින් වර සිදු කරනු ලබන අවශ්‍යතා විශ්ලේෂණ මත පදනම්ව අවශ්‍ය පරිදි පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරනු ලැබේ.

**මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුව**

වරින් වර සිදු කරනු ලබන අවශ්‍යතා විශ්ලේෂණ මත පදනම්ව අවශ්‍ය පරිදි පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරනු ලැබේ.

ඇමුණුම I

| ව්‍යාපෘතියේ නම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු අයවැයගත ප්‍රතිපාදනය (රු.මිලියන) | ඉලක්කගත කාලය | | | සත්‍ය වශයෙන් ආරම්භ කල දිනය | විචලතාවය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|---|---|
| | | වැඩ ආරම්භ කිරීමට නියමිත වූ දිනය | වැඩ නිම කිරීමට මූලිකව අපේක්ෂා කල දිනය | වැඩ නිම කිරීමට පසුව අපේක්ෂා කල දිනය | | | |
| Supply & Installation of Motorized vales of AHUs, Central Control and Monitoring system | 28 | 2020 ඔක්තෝම්බර් 22 | 2021 මැයි 20 | 2022 සැප්තැම්බර් 30 | 2021 නොවැම්බර් 2 | මූලිකව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය සහ පසුව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය අතර දින 499 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.<br>රුපියල් මිලියන 10.411 ක් පමණක් භාවිතා කර ඇති අතර තවමත් වැඩ සිදු වෙමින් පවතී. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංකා බැංකුවේ කළමනාකාරීත්වය පහත දැක්වෙන පරිදි ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ බාහිර කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති ඉදිකිරීම්/ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවීමට තීරණය කර ඇත.<br>අ. දෙවන රැල්ල - 2020/10/25 සිට 2021/04/06 දක්වා<br>ආ. තෙවන රැල්ල - 2021/04/28 සිට 2021/08/02 දක්වා<br>ඉහත වැඩ කටයුතු අත්හිටුවීම සහ නොස්ටර්ස් පුද්ගලික සමාගමේ කාර්ය මණ්ඩලය අතර කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද විය. |
| Replacement of Condenser Water Piping System from Floor 17 to Rooftop | 3 | 2021 දෙසැම්බර් | - | - | - | ව්‍යාපෘතිය 2024 දක්වා කල් දමන ලදී. | ව්‍යාපෘතිය 2024 දක්වා කල් දැමීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදී. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Supply & Installation of Fresh Air Supply Fans at Floor 17 | 3.5 | 2021 ජූලි 30 | 2021 නොවැම්බර් 27 | 2022 ජනවාරි 15 | 2021 දෙසැම්බර් 20 | මූලිකව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය සහ පසුව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය අතර දින 143 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.<br><br>සම්පූර්ණ වැඩ නිම කිරීම සඳහා අයවැයෙන් රුපියල් මිලියන 2.8 ක් පමණක් භාවිතා කර ඇත. | ස්පාඤ්ඤයේ “එස් ඇන්ඩ් පී” කර්මාන්තශාලාවේ වායු සමීකරණ විදුලි පංකා නිෂ්පාදනය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද විය. |
| Replacement of Timer Ceiling on Floors 1 & 3 with Aluminium Composite panel Ceiling | 8 | 2020 ඔක්තෝම්බර් 13 | 2021 පෙබරවාරි 10 | 2022 මාර්තු 31 | 2021 අගෝස්තු 02 | . | |
| Purchase of a new standby AHU Unit | 3 | - | - | - | - | Standby AHU ඒකක මිලදී ගැනීම අවලංගු කරන ලදී. | Standby AHU ඒකක මිලදී ගැනීම අවලංගු කිරීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදී. |
| Replacement of Timer Ceiling on Floors 1 & 3 with Aluminium Composite panel Ceiling | 8 | 2020 ඔක්තෝම්බර් 13 | 2021 පෙබරවාරි 10 | 2022 මාර්තු 31 | 2021 අගෝස්තු 02 | මූලිකව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය සහ පසුව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය අතර දින 294 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.<br>ව්‍යාපෘතිය සත්‍ය වශයෙන්ම ආරම්භ කරන විට එහි වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනයද ඉක්මවා ගොස් ඇත.<br>මුළු අයවැයෙන් රුපියල් මිලියන 1.9 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා යොදවා ඇත. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංකා බැංකුවේ කළමනාකාරීත්වය පහත දැක්වෙන පරිදි ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ බාහිර කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති ඉදිකිරීම්/ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවීමට තීරණය කර ඇත.<br>අ. දෙවන රැල්ල - 2020/10/25 සිට 2021/04/06 දක්වා<br>ආ. තෙවන රැල්ල - 2021/04/28 සිට 2021/08/02 දක්වා<br>ඉහත වැඩ කටයුතු අත්හිටුවීම සහ වෙළඳපොලේ ඇති අළුමිනියම් සංයුක්ත පැනල් වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද විය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Renovations to Life Lobbies at Floors 1 & 2 | 8 | 2020 මාර්තු 20 | 2020 සැප්තැම්බර් 16 | 2022 සැප්තැම්බර් 14 | 2021 අගෝස්තු 02 | මූලිකව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය සහ පසුව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය අතර දින 499 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය සත්‍ය වශයෙන්ම ආරම්භ කරන විට එහි වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනයද ඉක්මවා ගොස් ඇත.<br>මුළු අයවැයෙන් රුපියල් මිලියන 0.5 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා යොදවා ඇත. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංකා බැංකුවේ කළමනාකාරීත්වය පහත දැක්වෙන පරිදි ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ බාහිර කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති ඉදිකිරීම්/ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවීමට තීරණය කර ඇත.<br>අ. පළමු රැල්ල - 2020/03/20 සිට 07/09/2020 දක්වා<br>ආ.දෙවන රැල්ල - 2020/10/25 සිට 2021/04/06 දක්වා<br>ඇ. තෙවන රැල්ල - 2021/04/28 සිට 2021/08/02 දක්වා<br>ඉහත වැඩ කටයුතු අත්හිටුවීම සහ වෙළඳපොලේ ටයිල් වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද විය. |
| Upgrading/ Modernization of Centre Core Toilets in Basements 2 & 3 and Outer Core Toilets in Floor 30 | 4.5 | 2021 ජනවාරි 15 | 2021 ජූලි 14 | 2023 මාර්තු 31 | 1. තවම ආරම්භ කර නොමැත.<br>2. කොන්ත්‍රාත් කරු අවශ්‍ය ටයිල් සඳහා ඇණවුම ලබා දී ඇත.<br>3. සනීපාරක්ෂක සවිකිරීම් 2022/01/3දින වැඩබිම වෙත ලබා දී ඇත. | 2022 ඔක්තෝම්බර් 06 දිනැති විගණිත දිනය දක්වා ව්‍යාපෘතිය ප්‍රමාද කර ඇත. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංකා බැංකුවේ කළමනාකාරීත්වය පහත දැක්වෙන පරිදි ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ බාහිර කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති ඉදිකිරීම්/ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවීමට තීරණය කර ඇත.<br>අ. දෙවන රැල්ල - 2020/10/25 සිට 2021/04/06 දක්වා<br>ආ. තෙවන රැල්ල - 2021/04/28 සිට 2021/08/02 දක්වා<br>ඉහත වැඩ කටයුතු අත්හිටුවීම සහ වෙළඳපොලේ ටයිල් වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද විය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Replacement of 11 KV Power Cables from Basement 2 to Floor 17 & Replacement of 11 KV Isolator panel on Floor 17 | 7 | - | - | - | - | ව්‍යාපෘතිය 2022 වර්ෂය දක්වා ප්‍රමාද කර ඇති අතර ආරම්භක දිනය මේ වන තුරු තීරණය කර නොමැත. | 2022 අප්‍රේල් 01 වන දින මිනෙල් ලංකා (පුද්ගලික) සමාගම වෙත කොන්ත්‍රාත්තුව ප්‍රධානය කරන ලදී. විදේශ මුදල් හිඟය හේතුවෙන් අවශ්‍ය කේබල් සහ මුදු ප්‍රධාන ඒකකය ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාද විය. |
| Replacement/ Retrofitting of LV Switchgear panels in Basements 2 & on Floor 17 | 6 | - | - | - | - | ව්‍යාපෘතිය 2023 දක්වා කල් දමන ලදී. | ව්‍යාපෘතිය 2023 දක්වා කල් දැමීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදී. |
| Fire Detection & Protection System | 58 | 2020 අගෝස්තු 17 | 2021 ජූලි 12 | 2022 ඔක්තෝම්බර් 15 | 2020 සැප්තැම්බර් 14 | මූලිකව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය සහ පසුව වැඩ නිම කිරීමට අපේක්ෂා කල දිනය අතර දින 460 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.<br>සම්පූරණ වැඩ නිම කිරීම සඳහා අයවැයෙන් රුපියල් මිලියන 20.982 ක් පමණක් භාවිතා කර ඇත | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංකා බැංකුවේ කළමනාකාරීත්වය පහත දැක්වෙන පරිදි ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ බාහිර කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති ඉදිකිරීම්/ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවීමට තීරණය කර ඇත.<br>අ. පළමු රැල්ල - 2020/03/20 සිට 07/09/2020 දක්වා<br>ආ. දෙවන රැල්ල - 2020/10/25 සිට 2021/04/06 දක්වා<br>ඇ. තෙවන රැල්ල - 2021/04/28 සිට 2021/08/02 දක්වා<br>ඉහත වැඩ කටයුතු අත්හිටුවීම සහ රාත්‍රී කාලයේ ගොඩනැගිල්ලේ කාර්යාල පරිශ්‍රයට ප්‍රවේශ වීමේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද විය. |